# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ **2005** අගෝස්තු මස **24** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 අගෝස්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 16.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 7.50 යි.

# 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2005 අගෝස්තු මස 24 වන දින]

එල්. ඩී.–ඕ. 19/2004.

**උඩරට ප්‍රදේශය තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හඳුනා ගැනීම, සැකසුම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පිහිටුවීම

**2**. (1) ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වන ලබන (මෙහි මින් මතු “ අධිකාරිය” යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

(2) අධිකාරිය, (1) වන උපවගන්තියෙන් දෙනු ලැබූ නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අඛණ්ඩ පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එකී සංස්ථා නාමයෙන් ඒ අධිකාරිය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**3**. (1) මේ පනතේ කාර්ය සඳහා, අධිකාරියේ බල ප්‍රදේශය මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මොණරාගල සහ අම්පාර පරිපාලන දිස්ත්‍රික්ක යටතට ගැනෙන ඕනෑම ප්‍රදේශයකට සීමා විය යුතු ය.

අධිකාරියේ බල ප්‍රදේශය.

(2) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කලින් කලට, ඉහත කී පරිපාලන දිස්ත්‍රික්කවලින් ඕනෑම එකක් යටතට ගැනෙන යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ එවැනි කොට්ඨාසයකින් යම් කොටසක්, මේ පනතේ කාර්ය සඳහා “ නම් කළ ප්‍රදේශයක්” ලෙස හඳුනාගනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන තාක් දුරට, නම් කළ ප්‍රදේශයෙන් පිටත ශාඛා කාර්යාල පවත්වාගෙන යාමටත්, වෙනත් ක්‍රියාකාරකම්වල නිරත වීමටත් අධිකාරයට හැකි ය.

2–P L 000325–4,500 (2005/06)

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය.

**4**. අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු, පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත, කළමනාකරණ මණ්ඩලයක් (මෙහි මින් මතු " මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සතු විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් —

(i) උඩරට සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ තත්ත්වය දරන, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධරයකු ;

(iii) වතු යටිතල පහසුකම් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා, විසින් නම් කරනු ලබන නිලධරයකු ; සහ

(ආ) අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් පස්දෙනෙක්.

අධිකාරියේ සභාපතිවරයා.

**5**. (1) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු, (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා, සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් ඒ වෙනුවට කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(3) ජනාධිපතිවරයා විසින්, හේතු දක්වා, සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ජනාධිපතිවරයා විසින් ඒ ඉල්ලා අස්වීම පිළිගනු ලබන දිනයේ සිට ඒ ඉල්ලා අස්වීම වලංගු සහ බලාත්මක විය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුසුකම්.

6. යම් තැනැත්තකු —

(අ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් ;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම නතර වී ඇත්නම් ;

(ඇ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට තීරණය කොට හෝ ප්‍රකාශ කොට ඇති තැනැත්තකු වේ නම් ;

(ඈ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් විඳිමින් සිටින හෝ විඳ සිටින තැනැත්තකු වේ නම් ;

(ඉ) ඔහු අධිකාරිය විසින් හෝ අධිකාරිය වෙනුවෙන් එළඹෙන ලද ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් භුක්ති විඳින්නේ නම් ;

(ඊ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ, බුන්වත් භාවයෙන් හෝ බංකොලොත් භාවයෙන් නිදහස් නොකරන ලද තැනැත්තකු වේ නම්,

ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට සහ සාමාජිකයකු ලෙස අඛණ්ඩව සිටීමට නුසුදුස්සකු විය යුතු ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

7. (1) පත් කළ සාමාජිකයකු විසින්, ජනාධිපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගනු ලැබූ විට එය බලාත්මක විය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, හේතු දක්වා පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3) පත් කළ සාමාජිකයකු මිය ගොස් ඇති, ඉල්ලා අස්වී ඇති හෝ ධුරයෙන් ඉවත් කර ඇති අවස්ථාවක දී, 4 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින් ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් සාමාජිකයකු පත් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයකු, ඔහු අනුප්‍රාප්ත වූයේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති ධුර කාලය සඳහා, ධුරය දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**8**. (1) 7 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය වසර පහක් විය යුතු අතර, ඒ සාමාජිකයා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(2) ධුරයෙන් ඉවත් කරන ලද පත් කළ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට සහ වෙනත් කිසිම තත්ත්වයකින් අධිකාරියට සේවය කිරීමට සුදුස්සකු නොවිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

**9**. (1) අධිකාරියේ සභාපතිවරයා මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට ඔහු නොපැමිණ සිටි අවස්ථාවක දී, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ සාමාජිකයන්ගෙන් කෙනකු රැස්වීමේ මුලසුන දැරීමට තෝරා පත් කරගත යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය අධිකාරිය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**10**. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ පාරිශ්‍රමික අධිකාරියේ සාමාජිකයන්ට, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ක්‍රියා අවලංගු නොවන බව.

**11**. මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හෝ අධිකාරියේ යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතුකොටගෙන අධිකාරියේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුතු කිසිවක් අවලංගු වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

අධිකාරිය රජයේ පොදු ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කළ යුතු බව.

**12**. අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී, රජයේ පොදු ප්‍රතිපත්තියට සහ ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍යවරයා විසින් නිකුත් කරන සාමාන්‍ය සහ විශේෂ විධානවලට අනුකූලව, අධිකාරිය ක්‍රියා කළ යුතු ය.

**13**. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකු භාරයේ තැබිය යුතු ය. අධිකාරියේ මුද්‍රාව.

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා සහ මණ්ඩලයේ තවත් එක් සාමාජිකයකු ඉදිරියේ දී මිස, අධිකාරියේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයේ අත්සන් කළ යුතු ය :

එසේ වුව ද, අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීමේ දී පැමිණ සිටීමට සභාපතිවරයාට නොහැකි වන අවස්ථාවක දී, තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට, මේ උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව එවැනි යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් අත්සන් කිරීමට නිසි බලය තිබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

## II වන පරිච්ඡේදය

## අධිකාරියේ පරමාර්ථ සහ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**14**. අධිකාරියේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය :— අධිකාරියේ පරමාර්ථ.

(අ) නිෂ්පාදනශීලීත්වය නංවාලීමට, ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ පාරිසරික සංවර්ධනය වැඩි දියුණු කිරීමට සහ ආදායම් සහ රැකියා අවස්ථා උත්පාදනය කිරීමට යම් නම් කළ ප්‍රදේශයක් තුළ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ආ) නම් කළ ප්‍රදේශය සඳහා වූ සමස්ත සංවර්ධන සැලසුමෙහි දී හඳුනාගෙන ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තරාත්මක අධ්‍යයන කිරීම ;

(ඇ) ඓතිහාසික, සමාජයීය සහ වෙනත් හේතු නිසා කොන් වී සිටින ජන කොටස් හඳුනාගැනීම සහ ඔවුන්ගේ සමාජයීය සහ ආර්ථික තත්ත්වය නැංවීමට යෝජනා සකස් කිරීම, අරමුදල් රැස් කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම ;

(ඈ) මහනුවර නගරයේ, ඓතිහාසික වැදගත්කම සහ මුළු ජාතියට ම එහි ඇති සංස්කෘතික හා ආර්ථික වැදගත්කම සැලකිල්ලට ගනිමින්, මහනුවර නගරය සහ එහි උරුමය ද, සංස්කෘතික ආයතන ද, පරිසරය සහ යටිතල පහසුකම් ද සංරක්ෂණය කිරීම කෙරෙහි විශේෂ අවධානය ව්‍යාප්ත කිරීම ;

(ඉ) යම් නම් කළ ප්‍රදේශයක් තුළ (ආ) ඡේදයේ සඳහන් කර ඇති අධ්‍යයන කිරීමේ දී සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, පළාත් සභා බලධරයන්ගෙන් සහ ස්වභාවික හෝ නෛතික වුව ද, පෞද්ගලික හෝ රාජ්‍ය වුව ද වෙනත් පුද්ගලයන්ගෙන් ද සහයෝගීතාවය ලබාගැනීම ;

(ඊ) යම් නම් කළ ප්‍රදේශයක් තුළ, (ආ) ඡේදයේ සඳහන් කර ඇති, විස්තරාත්මක අධ්‍යයන කිරීමේ දී සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විදේශීය සහ දේශීය, පුද්ගලික අංශයේ නියෝජ්‍යායතනවල සහභාගිත්වය ලබා ගැනීම.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**15**. අධිකාරියේ පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ හැකි ය :—

(අ) යම් නම් කළ ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම සහ අනුමත කිරීම ;

(ආ) අධිකාරියේ පරමාර්ථ ක්‍රියාවට නැංවීම සඳහා දේශීය සහ විදේශීය මූලාශ්‍රවලින් තාක්ෂණික සහ මූල්‍යමය සහාය ලබාගැනීම සහ සුරක්ෂිත කිරීම ;

(ඇ) යම් නම් කළ ප්‍රදේශයක් තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අරමුණු කොටගෙන අධ්‍යයන කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා දේශීය සහ විදේශීය සහාය ලබා ගැනීම ;

(ඈ) යම් නම් කළ ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මකව පවතින, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි වගකීම පැවරී ඇති යම් අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් නියෝජ්‍යායතනයකට, ඒ ව්‍යාපෘති සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට නියම කිරීම ;

(ඉ) අධිකාරියේ යම් සංවර්ධන ව්‍යාපෘතියක් භාර ගැනීමට, පවත්වාගෙන යාමට සහ මෙහෙයවීමට යම් අමාත්‍යාංශයකින්, රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ වෙනත් නියෝජ්‍යායතනයකින් ඉල්ලා සිටීම ;

(ඊ) යම් නම් කළ ප්‍රදේශයක් තුළ, ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය අධිකාරියේ ම අංශ සහ නියෝජ්‍යායතන පිහිටුවීම ;

(උ) නම් කළ ප්‍රදේශවල ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ පාරිසරික සංවර්ධනයට අදාළ පර්යේෂණ කටයුතු කිරීම ;

(ඌ) යම් නම් කළ ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක කළ යුතු යම් සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් සකස් කිරීම ;

(එ) රජය විසින් සකස් කොට ඇති ටෙන්ඩර් කාර්ය පටිපාටියට අනුව, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ සහ සේවා සැපයීමට, කලින් කලට ටෙන්ඩර් ප්‍රදානය කිරීම ;

(ඒ) නම් කළ ප්‍රදේශය තුළ අධිකාරිය විසින් ලබා දෙන ලද සේවා සඳහා ගාස්තු පැනවීම හෝ අය කිරීම ;

(ඔ) යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි, කාර්යාල, යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ හෝ වෙනත් ද්‍රව්‍ය, මිල දී ගැනීම, අත්පත් කර ගැනීම, ගොඩ නැංවීම, නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ අනුවර්තනය කිරීම ;

(ඕ) රජයේ හෝ පෞද්ගලික ආයතන මගින් හෝ රජය සහ පෞද්ගලික ආයතන හවුල්ව හෝ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ;

(ක) යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මුදල් ශ්‍රී ලංකාවේ මූලාශ්‍රවලින් ණයට ගැනීම හෝ ලබාගැනීම සහ බැඳීම් අත්කර ගැනීම ;

(ග) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කරගැනීම ;

(ච) අදාළ අමාත්‍යාංශ සමග එක්ව, දිය බෙත්ම කළමනාකරණය කිරීම සහ පාංශු ඛාදනය පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ජ) අදාළ අමාත්‍යාංශ සහ පුද්ගලික ව්‍යාවසායන් සමග එක්ව, ගොවිපළවල් කළමනාකරණය කිරීම, සහ ගොවිතැන් කටයුතු, කෘෂිකාර්මික කටයුතු සහ උද්‍යාන විද්‍යා කටයුතුවල නිරත වීම ;

(ට) භෞතික පරිසරයේ වැවිලි තාක්ෂණ ක්‍රම, ජල කළමනාකරණය, පාංශු කළමනාකරණය සහ සංරක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා උපදේශක සහ ගොවි පුහුණු සේවා සපයා දීම ;

(ඩ) රජයේ සහ පෞද්ගලික බැංකු සමග එක්ව ගොවියනට අධීක්ෂිත ණය යෝජනා ක්‍රම කළමනාකරණය කර ක්‍රියාත්මක කිරීම ;

(ණ) ගොවියනට බීජ ද්‍රව්‍ය, පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, විදුලි බලය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ උපකරණ වැනි කෘෂිකාර්මික යෙදවුම් සපයාදීම ;

(ත) අදාළ අමාත්‍යාංශ සමග එක්ව, කෘෂිකර්මය සහ කෘෂි මූලික නැතහොත් ඊට සම්බන්ධ වූ කර්මාන්තවල සංවර්ධනයට අදාළ පර්යේෂණ පැවැත්වීමට පහසුකම් සැලසීම සහ ගිවිසුම් ඇතිකර ගැනීම ;

(ද) කෘෂි මූලික නැතහොත් ඒවාට සම්බන්ධ වූ කාර්මික හෝ වාණිජ ව්‍යවසාය පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම ;

(න) ගොවිපලවල නිෂ්පාදන සහ වෙනත් නිෂ්පාදන මිලට ගැනීම, ගබඩා කිරීම, සකස් කිරීම සහ විකිණීම සඳහා අලෙවි සේවා පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම ;

(ප) ඕනෑම ආකාරයක යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ, මෙවලම්, භාණ්ඩ හෝ දේවල නිෂ්පාදනය සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීම ;

(බ) භාණ්ඩ, නිෂ්පාදන, ද්‍රව්‍ය සහ වෙළඳ ද්‍රව්‍ය ආනයනය, අපනයනය, මිලට ගැනීම, විකිණීම සහ ඒවා පිළිබඳ අන්‍යාකාරයෙන් කටයුතු කිරීම ;

(ම) අධිකාරියේ අරමුණු ප්‍රවර්ධනය කිරීමට සහ නංවාලීමට ඉඩ ඇති යම් සමාගමක, සමිතියක හෝ ව්‍යාපාරයක කොටස්වලට හෝ ස්කන්ධවලට දායක වීමෙන්, ඒවා මිලට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, ගැනීම, දැරීම සහ විකිණීම ;

(ය) යම් සමාගමකට කරන ලද විකිණීමක් සඳහා හෝ යම් සමාගමකින් අයවීමට ඇති ණයක් සඳහා කරනු ලබන ගෙවීමක් හෝ එවැන්නකින් කොටසක් ගෙවීමක් වශයෙන් එවැනි යම් සමාගමක ස්කන්ධ හෝ කොටස් නැතහොත් සෘණපත්‍ර හෝ වෙනත් ඇපකර පිළිගැනීම ;

(අඅ) අධිකාරියේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ අරමුණින් පාලිත සමාගම් ප්‍රවර්ධනය කිරීම, ඒවාට ආයෝජනය කිරීම සහ සහභාගි වීම ; සහ

(ආආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අධිකාරියේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා නැතහොත් මේ පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික සියලු ක්‍රියා කිරීම.

ගිවිසුම්වලට එළඹීමට මණ්ඩලයට ඇති බලතල.

**16**. (1) අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ කාර්යය සඳහා යම් රජයේ දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් හෝ හවුල් ව්‍යවසායන් ඇතුළුව වෙනත් පොදු හෝ පෞද්ගලික පුද්ගල මණ්ඩලයක් හෝ තැනැත්තකු සමග ද, ගිවිසුම්වලට එළඹීමට, අධිකාරියට බලය තිබිය යුතු ය.

(2) එවැනි සෑම ගිවිසුමක් ම ලියවිල්ලකින් විය යුතු අතර, අධිකාරියෙහි ලියාපදිංචි කරනු ලැබීමේ දී, අධිකාරිය සහ ඒ රජයේ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතනය හෝ වෙනත් පුද්ගල මණ්ඩලය හෝ තැනැත්තා අතර වලංගු සහ අනුගම්‍ය ගිවිසුමක් විය යුතු ය.

අධිකාරිය වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී ක්‍රියා කිරීමට තැනැත්තන්ට බලය දීම.

**17**. ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක දී අධිකාරිය සඳහා හෝ අධිකාරිය වෙනුවෙන් කටයුතු කිරීමට පොදුවේ හෝ යම් නිශ්චිත කාරණයක් වෙනුවෙන් හෝ, යම් තැනැත්තකුට මණ්ඩලය විසින් අධිකාරියේ මුද්‍රාව යටතේ ලියවිල්ලකින් හෝ අධිකාරිය විසින් සාදනු ලබන රීතිවල විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් ආකාරයකට හෝ බලය පවරනු ලැබිය හැකි ය.

රජයේ යම් දෙපාර්තමේන්තුවකට හෝ සංස්ථාවකට විධාන නිකුත් කිරීමට මණ්ඩලයට ඇති බලය.

**18**. (1) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන අවස්ථාවක දී, නම් කළ ප්‍රදේශය තුළ හෝ ඒ ප්‍රදේශයට අදාළ හෝ යම් සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් යම් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් විසින් කළ යුතු යයි අධිකාරිය තීරණය කරන කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ඉටු කරන ලෙස සහ, ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව ඒ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව විමසීමෙන් පසුව ඒ දෙපාර්තමේන්තුවට හෝ සංස්ථාවට විශේෂ හෝ පොදු විධාන, අධිකාරිය විසින් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් එවැනි යම් දෙපාර්තමේන්තුවකට හෝ සංස්ථාවකට දෙනු ලැබූ විධානයක් ඒ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව විසින් පිළිපැදීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් විධානයක් දෙනු ලැබූ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක්, ආඥාපනත්ක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ඒ විධානයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරියේ අධීක්ෂණයට සහ පාලනයට යටත් විය යුතු ය.

ඉඩම් අනිවාර්යෙන් අත්කර ගැනීම.

**19**. (1) අධිකාරියේ යම් කාර්යයක් සඳහා නම් කළ ප්‍රදේශයක පිහිටි යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් අධිකාරියට අවශ්‍යව ඇත්තා වූ ද, යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අනුමත කර ඇත්තා වූ ද අවස්ථාවක දී, ඒ ඉඩම හෝ ඉඩමක යම් සම්බන්ධතාව පොදු කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් ලෙස සලකනු ලැබේ. ඒ අනුව, ඒ ඉඩම හෝ යම් ඉඩමක සම්බන්ධතාව (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගනු ලැබ, අධිකාරිය වෙත පවරා දෙනු ලැබිය හැකි ය :

එසේ වුව ද, නම් කළ ප්‍රදේශයක් තුළ පිහිට වතුයායක, ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් අධිකාරියට අවශ්‍යව ඇති අවස්ථාවක, ඒ ඉඩම හෝ ඒ ඉඩමේ ඒ සම්බන්ධතාව අත්කර ගැනීම සඳහා, මේ වගන්තිය යටතේ නියමයක් පළ කිරීමට පෙර, අමාත්‍යවරයා විසින්, වතු යටිතල පහසුකම් විෂයය භාර අමාත්‍යවරයා විමසිය යුතු ය.

(2) අධිකාරියේ යම් කාර්යයක් සඳහා, නම් කළ ප්‍රදේශයක පිහිටි යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට අවශ්‍යව ඇත්තා වූ ද, (1) වන උපවගන්තිය යටතේ වූ නියමය පළ කරනු ලැබූ දිනයේ සිට වූ අවුරුදු තුනක කාලය ඇතුළත කවර හෝ විටක එකී ඉඩම හෝ එකී සම්බන්ධතාව අත්කර ගැනීමේ අදහස පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් එකී පනතින් නියම කර ඇති පරිදි පළ කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක දී, එකී ඉඩම් අත්කර

ගැනීමේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඒ ඉඩම හෝ ඒ සම්බන්ධතාව වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල තීරණය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) ඒ ඉඩම අත්කර ගන්නා අවස්ථාවේ දී ඒ ඉඩම පවත්නා තත්ත්වය, එකී නියමය කරන ලද දිනයේ දී ඒ ඉඩමේ පැවති තත්ත්වය ම වේ නම්, එදිනට ඒ ඉඩමට ලබාගත හැකිව තිබුණු වෙළෙඳ අගයට, නියම කරන ලද දිනයෙන් පසුව ඒ ඉඩමට සද්භාවයෙන් කරන ලද වැඩි දියුණු කිරීම් කිසිවක් වේ නම් ඒවා සඳහා යුක්ති සහගත මුදලක්, එකතු කිරීමෙන් ලැබෙන අගය, ඒ ඉඩමේ වෙළෙඳ අගය ලෙස සැලකිය යුතු ය ;

(ආ) එකී නියමය කරනු ලැබූ දිනයේ ඒ ඉඩමේ පැවති වෙළෙඳ අගය නිශ්චය කිරීමේ දී, පනත ප්‍රකාර අධිකාරිය විසින් කරනු ලැබ ඇති යම් සංවර්ධන වැඩ හෝ වෙනත් කටයුතු හේතු කොට ගෙන ඍජු ලෙස හෝ වක්‍ර ලෙස උපචිත වූ යම් ප්‍රතිලාභයක් හෝ අගය වැඩිවීමක් සහ එසේ උපචිත විය හැකි යම් ප්‍රතිලාභයක් නැතහොත් අගය වැඩිවීමක් පිළිබඳ යම් බලාපොරොත්තුවක් සැලකිල්ලට නොගත යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නම් කළ ප්‍රදේශයක් තුළ පිහිටි යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් අත්කර ගැනීම නිසා, යම් තැනැත්තකුගේ ස්ථිර වාසස්ථානයට හෝ ජීවිකාවට අලාභයක් හෝ හානියක් සිදුවන අවස්ථාවක දී, (2) වන උපවගන්තිය යටතේ එම තැනැත්තාට ගෙවනු ලබන වන්දි මුදලට අමතරව, ස්ව කැමැත්තෙන් තොරව පුනස්ථාපනය කිරීමේ ජාතික ප්‍රතිපත්තියට අනුව එම තැනැත්තාට වන්දි ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය සඳහා අත්කර ගනු ලැබූ යම් ඉඩමක් හෝ යම් ඉඩමක සම්බන්ධතාවක් සම්බන්ධයෙන් වන්දි වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් අධිකාරිය විසින් ගෙවිය යුතු ය.

රජයේ චංචල හා නිශ්චල දේපළ, අධිකාරියට ලබා දිය යුතු බව.

**20**. (1) රජයේ යම් නිශ්චල දේපළක්, අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, ඒ දේපළ (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි හෝ කාර්යයක් සේ සැලකිය යුතු අතර, ඒ අනුව, අධිකාරිය වෙත ඒ දේපළ සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට හෝ ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) රජයේ යම් චංචල දේපළක්, අධිකාරියේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින්, ඒ චංචල දේපළෙහි සන්තකය හා ප්‍රයෝජනය අධිකාරිය වෙත පවරා සතු කර දිය හැකි ය :

එසේ වුව ද, රජයේ යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසිම නියමයක්, ඒ දේපළෙහි පාලනය දරන අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නොකළ යුතු ය.

## III වන පරිච්ඡේදය

## මුදල්

අධිකාරියේ අරමුදල.

**21**. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියේ ම අරමුදලක් අධිකාරියට තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කර දෙනු ලබන සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ අධිකාරියට දී ඇති සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ;

(ඇ) ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ;

(ඈ) අධිකාරියේ බැරට උපචිත වන සියලු මුදල්.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරනු ලබන වියදම් ගෙවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**22**. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, අධිකාරියේ කාර්ය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් යම් රාජ්‍ය සංස්ථාවකට හෝ රජයේ යම් දෙපාර්තමේන්තුවකට අරමුදල් වෙන්කර දෙනු ලැබිය හැකි අතර, ඒ කාර්ය කිරීම සහ ඒ කාර්ය කිරීමෙහි ලා දරන ලද යම් වියදම් පිළිබඳව යථා පරිදි ගණන් ඉදිරිපත් කිරීම, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්යය විය යුතු ය.

ඇතැම් කාර්ය කිරීම සඳහා සහාය වන ලෙස රාජ්‍ය සංස්ථා වලින් සහ රජයේ දෙපාර්තමේන්තු වලින් ඉල්ලා සිටීමට අධිකාරියට බලය ඇති බව.

(2) (1) වන උපවගන්තිය යටතේ අරමුදල් වෙන්කර දෙනු ලබන යම් සංස්ථාවක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් විසින්, ඒ අරමුදල් වියදම් කළ ආකාරය සම්බන්ධයෙන් සැපයිය යුතු යයි අධිකාරිය විසින් නියම කරනු ලබන තොරතුරු, අධිකාරිය වෙත සපයන ලෙස එවැනි යම් සංස්ථාවකට හෝ දෙපාර්තමේන්තුවකට නියම කිරීමේ අයිතිවාසිකම අධිකාරිය සතු වන අතර, එවැනි නියමයකට අනුකූලව ක්‍රියා කිරීම ඒ සංස්ථාවේ හෝ දෙපාර්තමේන්තුවේ කාර්යය විය යුතු ය.

**23**. අධිකාරිය විසින් යෝග්‍ය යයි සලකනු ලබන බැංකුවක හෝ බැංකුවල, ගිණුමක් හෝ ගිණුම් පවත්වාගෙන යා හැකි අතර, ඒ ගිණුම හෝ ගිණුම්, රාජ්‍ය සංස්ථාවල මුල්‍යාමය කටයුතුවලට අදාළව ඇති මුල්‍යාමය නියෝගවලට අනුව පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

අධිකාරිය විසින් ගිණුම් පවත්වා ගැනීම.

**24**. අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද හෝ අධිකාරියේ අරමුදල්වලින් ආනයනය කරන ලද හෝ මිල දී ගන්නා ලද භාණ්ඩ, එවැනි යම් භාණ්ඩ පරිත්‍යාග කිරීම, ආනයනය කිරීම හෝ මිල දී ගැනීම අධිකාරියේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නේ යයි සලකනු ලැබුවහොත් අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, එම භාණ්ඩ මත තීරු බදු හෝ වෙනත් යම් බදු ගෙවීමෙන්, අධිකාරිය නිදහස් කරනු ලැබිය හැකි ය.

බදු ආදිය ගෙවීමෙන් අධිකාරිය නිදහස් කිරීම.

**25**. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා අදාළ වන්නේ ය.

**26**. (1) ජනාධිපතිවරයා විසින් අනුමත කරන ලද දේශීය, ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානවලින්, රජය විසින් මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව තීරණය කරනු ලබන නියම හා කොන්දේසි මත, මේ පනත යටතේ වූ කාර්ය කිරීම සඳහා ණය ලබාගැනීමට, මණ්ඩලයට මෙයින් බලය දෙනු ලැබේ.

අධිකාරිය විසින් ගනු ලබන ණය සහ රජයේ ඇපකර.

(2) මේ වගන්තිය යටතේ ලබාගැනීමට බලය දෙන ලද ණය, විදේශීය ව්‍යවහාර මුදල්වලින් සඳහන් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබාගන්නා ලද ණය සඳහා, රජය වෙනුවෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා ඇපවිය යුතු ය. ඇපවීම සිදු කළ වහාම, අමාත්‍යවරයා විසින් ඒ ඇපවීම පිළිබඳ විස්තර දැක්වෙන ප්‍රකාශයක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ ඇපයක් පියවීම සඳහා අවශ්‍ය වන යම් මුදලක්, පාර්ලිමේන්තුවේ පූර්ව අනුමතය ඇතිව, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(5) ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලැබූ යම් ජාත්‍යන්තර හෝ විදේශීය සංවිධානයක් විසින් අධිකාරියට දෙනු ලැබූ සහ රජය ඇපවී ඇත්තා වූ යම් ණයක් සම්බන්ධයෙන් වන විට, ඒ ණය ප්‍රකාශ කොට ඇති ව්‍යවහාර මුදලට හෝ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියල නැවත අගය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන යම් පාඩුවක් රජය විසින් දැරිය යුතු අතර, එසේ සිදුවන යම් ලාභයක් රජයට හිමිවිය යුතු ය. තව ද එවැනි සෑම පාඩුවක ම මුදල් ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලට මෙයින් වැය බරක් විය යුතු ය.

(6) රජය සහ යම් දේශීය සංවිධානයක් අතර ඇති කරගනු ලබන යම් ඇප ගිවිසුමක් රජය වෙනුවෙන් තම අත්සන යටතේ වූ සාධන පත්‍රයක් මගින් අත්සන් කිරීමට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාට මෙයින් බලය පවරනු ලැබේ.

## IV වන පරිච්ඡේදය

## අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**27**. (1) මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත්කළ යුතු අතර, ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය සහ විශේෂ විධානවලට සහ පාලනයට යටත්ව, අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම ද, අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ද, අධිකාරියේ නිලධරයන් හා සේවකයන් පිළිබඳ පරිපාලනය සහ පාලනය ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය.

(3) මේ පනතින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ භාර කරනු ලැබූ බලතල, කර්තව්‍ය හෝ කාර්ය කිසිවක් යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන යම් අවස්ථාවක දී අධිකාරියේ අනුමතය ඇතිව, ඔහු විසින් ඒ බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරා දෙනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඒ නිලධරයා හෝ සේවකයා විසින් ඒ බලතල කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය.

**28**. (1) අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන යම් නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය. අධිකාරියේ කාර්ය මණ්ඩලය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ එසේ තීරණය කරනු ලබන ප්‍රමාණවලට අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනි කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට ගිවිසගෙන සිටින යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරන යම් කාලයක්, එකී ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා රජයට සේවය කළ කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අධිකාරියේ ඉල්ලීම පිට ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට, තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව අධිකාරිය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ එකී පළාත් පාලන ආයතනය එකඟ වන නියම සහ කොන්දේසි මත අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(8) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, (7) වන උපවගන්තිය යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුව ද සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල නිලධරයන් සහ සේවකයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**29**. (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු අධිකාරියේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට, එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලයකට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළුව අධිකාරිය සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වූ නියම සහ කොන්දේසි මත, එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තාවකාලිකව හෝ ස්ථිරව ම අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුව ද සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "පාලක මණ්ඩලය" යන යෙදුම යම් රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් යෙදී ඇති විටක, ඒ රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ පරිපාලනය සහ කළමනාකරණය පවරා දී ඇති වෙනත් මණ්ඩලයක් ඉන් අදහස් වේ.

## V වන පරිච්ඡේදය

### සාමාන්‍ය විධිවිධාන

**30**. (1) මණ්ඩලය වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ භාරකොට ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, අධිකාරිය විසින් ලිඛිතව සඳහන් කරනු ලබන කොන්දේසිවලට යටත්ව, මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු හෝ සභාපතිවරයා වෙත අභිනියෝජනය කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ බලතල ආදිය අභිනියෝජනය කිරීම.

(2) එවැනි යම් අභිනියෝජනය කිරීමක් තිබුණ ද, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ හැකි, ඉටු කළ හැකි හෝ කරනු ලැබිය හැකි වන්නේ ය.

**31**. යම් නම් කළ ප්‍රදේශයක පිහිටි යම් සංවර්ධන ව්‍යාපෘතියක් කරගෙන යාම සඳහා අධිකාරිය විසින් යම් පුද්ගලයකුට දෙනු ලැබූ මූල්‍ය ආධාර කිසිවක් ඒ ආධාර දෙනු ලැබූ කාර්ය උදෙසා ම යොදවනු ලබන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර අධිකාරිය විසින් ගත යුතු ය.

සංවර්ධන ව්‍යාපෘති කරගෙන යාම සඳහා දෙනු ලැබූ මූල්‍ය ආධාර එම කාර්ය සඳහා යොදවනු ලබන බවට අධිකාරිය වගබලා ගත යුතු බව.

**32**. අධිකාරියේ සාමාජිකයකු, හවුල්කරුවකු වන, අධ්‍යක්ෂවරයකු වන හෝ කොටස් හිමියකු වන හෝ අධිකාරියේ හවුල්කරුවකුට, අධ්‍යක්ෂවරයකුට හෝ කොටස් හිමියකුට වෙනත් යම් ආකාරයකින් සෘජුව ම හෝ වක්‍රව සම්බන්ධතාවක් ඇති යම් ව්‍යවසායක ආයෝජනයක් හෝ වෙනත් ආකාරයකින් ඒ ව්‍යවසාය සමග ව්‍යාපාරික කටයුතු කිසිවක් හෝ, ඒ ව්‍යාපාරික කටයුතු සඳහා අමාත්‍යවරයා විසින් අනුමතය දී ඇත්තේ නම් මිස, අධිකාරිය විසින් නොකළ යුතු ය.

අමාත්‍යවරයා විසින් අනුමත කළහොත් මිස, අධිකාරියේ සාමාජිකයකුගේ සම්බන්ධතා ඇති ව්‍යවසායක් සමග අධිකාරිය ව්‍යාපාරික කටයුතු නොකළ යුතු බව.

**33**. අධිකාරියේ ක්‍රියාකාරකම් සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කොට වාර්තා කළ යුතු යයි අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සියලු පහසුකම් අධිකාරිය විසින් සලස්වනු ලැබිය යුතු ය.

අධිකාරියේ ක්‍රියාකාරකම් ගැන විමර්ශන නියම කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**34**. (1) අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා, අධිකාරියේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොදු හෝ විශේෂ විධාන අධිකාරිය වෙත ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන පිළිපැදිය යුතු ය.

අමාත්‍යවරයාගේ විධාන.

(2) අධිකාරියේ දේපළ සහ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම අධිකාරියේ කාර්යය විය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වන බව.

**35**. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**36**. අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන මත කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

**37**. (1) (අ) අධිකාරිය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධාන මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව,

කිසිදු සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව හෝ පවරනු ලැබූ සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවනු ලැබූ හෝ අධිකාරිය විසින් අයකරගනු ලැබූ යම් නඩු ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් නඩුවක දී

හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ නඩුවේ දී ඒ තැනැත්තා විසින් අයකරනු ලැබ නොමැති නම් ඒ වියදම අධිකාරියේ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

**38**. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග, අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කොට ඇති වෙනත් යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු වුව ද ඒ නියෝගය යටතේ ඊට පෙර කරන ලද යම් දෙයකට හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

**39**. (1) මේ පනත යටතේ රීති සෑදීමට නියමිත හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) අධිකාරිය විසින් සාදනු ලැබූ සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් වෙනත් යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**40**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**41**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ පනතේ —

"සංවර්ධනය ව්‍යාපෘතිය" යන්නෙන්, නම් කළ ප්‍රදේශයෙහි නිෂ්පාදනය, ආදායම් හෝ සේවා නියුක්තිය ඇති කෙරෙන නැතහොත් ආර්ථික, සමාජයීය, සංස්කෘතික හෝ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කෙරෙන පොදු හෝ පෞද්ගලික ක්‍රියාකාරකමක් අදහස් වේ ;

"පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව" යන්නෙහි, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතෙන් ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතලවලට, ඉටු කරනු ලබන කාර්යවලට සහ කරනු ලබන කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ කිරීමට යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ ඇති කොට පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ඊට ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.